# පරිසර අමාත්‍යාංශය
# சுற்றாடல் அமைச்சு
# Ministry of Environment

"සොබාදම් පියස", අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சோபாதம் பியச", இல. 416/சி/1, ரொபர்ட் குணவர்தன மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Sobadam Piyasa", No. 416/C/1, Robert Gunawardana Mawatha, Battaramulla, Sri Lanka.
Gen. Tel. +94-11-2034100

ලේකම් / செயலாளர் / Secretary: +94-11-2034121
ෆැක්ස් / தொலை நகல் / Fax: +94-11-2879944

මගේ අංකය / எனது இல / My No: ENV/07/EETP&SP/EDU/02WED/23
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.05.

පරිසර චක්‍රලේඛ අංකය - 1/2023

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම ප්‍රධාන ලේකම්වරුන්
සියළුම රාජ්‍ය ලේකම්වරුන්
සියළුම පළාත් ලේකම්වරුන්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියළුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2023 ජුනි 05

එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනයේදී ගන්නා ලද තීරණයකට අනුව 1972 ජුනි 5 දින සිට 16 දින දක්වා ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවරදී මානව පරිසරය සුරැකීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ සමුළුව පවත්වන ලදි. ඉහත සමුළුවේ සමාරම්භ දිනය සනිටුහන් කිරීම සඳහා සෑම වසරකම ජුනි මස 05 වන දින ජගත් පරිසර දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර, මෙම දිනය සැමරීම සඳහා නිල වශයෙන් කටයුතු කරන එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ ආරම්භය එදින සිදුවන්නේ ද මෙම සමුළුවේ ප්‍රතිඵලයක් ලෙසය.

එතැන් පටන් දශක පහකට වැඩි කාලයක් කාලීන පාරිසරික තේමාවන් ඔස්සේ සමරනු ලබන ජගත් පරිසර දිනය ලෝක ප්‍රජාව පාරිසරික කතිකාවට මහ පැදු ගෝලීය වේදිකාවක් ලෙස ක්‍රියාත්මක වූ අතර, සමස්ථ පරිසරය පිළිබඳ එක් අරමුණක් යටතේ ජගත් මට්ටමෙන් අවධානය යොමුකරලීමත් සියළු පුරවැසියන් පරිසරය සුරැකීම සඳහා පෙළඹවීමටත් ජගත් පරිසර දිනය යොදා ගනී. එසේම 1972 වර්ෂයේ දී ජගත් පරිසර දිනය ප්‍රකාශයට පත් කර පළමු සැමරුමෙන් පසු වසර 50 ක් සම්පූර්ණ වීම සිදු වන බැවින් එයද සුවිශේෂී අවස්ථාවක් ලෙස සලකා සැමරීම සිදුකරනු ලැබේ.

02. එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් මෙම වසරේ ජගත් පරිසර දින තේමාව ලෙස "Beat Plastic Pollution" යන්න ඉදිරිපත් කර ඇත. ඒ අනුව **"ප්ලාස්ටික් මගින් සිදුවන දූෂණය පිටු දකිමු"** යන තේමාව යටතේ අප රට ද මෙම වසරේ ජගත් පරිසර දිනය සමරනු ලැබේ.

03. ප්ලාස්ටික් වර්තමානය වන විට ලොව බහුලව භාවිතා වන අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්ව ඇති අතර එමගින් මිනිසාට මෙන්ම පරිසරයට විශාල තර්ජනයක්ද මතුකරමින් සිටී. ලෝකයේ සිදුවන නිෂ්පාදන අතර ප්ලාස්ටික් පහසුවෙන් ලබා ගත හැකි නිෂ්පාදනයක් වන අතර එය වඩා ලාභදායී, පහසුවෙන් භාවිතා කළ හැකි, ප්‍රවාහනය කළ හැකි, පහසුවෙන් ඉවත දැමිය හැකි හා කල් පවතින ද්‍රව්‍යයක්ද වේ. මෙම ලක්ෂණ අනුව ප්ලාස්ටික් ප්‍රබල පරිසර දූෂකයක් බවට පත්ව ඇති අතර, බොහෝ අකාරවලින් පරිසරයට හානි සිදු කරනු ලැබේ. ප්ලාස්ටික් පිළිස්සීමෙන් වාතය දූෂණයද, භූමියට එක් වීමෙන් පස දූෂණයද, ජල ප්‍රභවයන්ට එක්වීමෙන් ජලයද දූෂණයට ලක් වන අතර අවසානයේ මානව සෞඛ්‍යයට සිදු වන බලපෑම සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇත.

04. ඒ අනුව ශ්‍රී ලංකාවේද අනාගත පරපුරෙහි පැවැත්ම සඳහා පරිසර සංරක්ෂණය හා කළමනාකරණය උදෙසා ප්ලාස්ටික් හා පොලිතීන් නිෂ්පාදකයාගේ සිට ඒවා පරිහරණය කරන අවසාන පරිභෝගිකයා දක්වා පරිසර හිතකාමී නිෂ්පාදන දිරිගැන්වීම, අවභාවිතය අඩු කිරීම, නිවැරදිව බැහැර කිරීම, ප්‍රතිචක්‍රීකරණයට යොමු කිරීමට දිරි ගැන්වීම හා දැනුවත් කිරීමෙන් සියළු පුරවැසියන් පරිසරය සුරැකීම සඳහා පෙළඹවීමටත් ජගත් පරිසර දිනය සුවිශේෂී අවස්ථාවක් ලෙස සලකා සැමරීම සිදුකළ යුතුව ඇත.

05. මේ සඳහා "ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන" යන මැයෙන් යුතුව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ජගත් පරිසර දින ජාතික උත්සවයට සමගාමීව **"ජාතික පරිසර සතියක්"** ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව මෙම වර්ෂයේ ද මැයි 30 සිට ජුනි 05 දක්වා සතිය "ජාතික පරිසර සතිය" ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එම දිනයන් පහත පරිදි නම් කර ඇත.

| | |
|---|---|
| මැයි 30 | රුක්රෝපණය දිනය |
| මැයි 31 | වායු දූෂණය හා එහි අහිතකර බලපෑම් අවම කිරීමේ දිනය |
| ජුනි 01 | පරිසර පවිත්‍ර කිරීමේ දිනය |
| ජුනි 02 | ජෛව විවිධත්වය සංරක්ෂණ දිනය |
| ජුනි 03 | ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය |
| ජුනි 04 | තිරසර ඉඩම් කළමනාකරණ දිනය |
| ජුනි 05 | ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ දිනය හා ජගත් පරිසර දින සැමරුම |

06. ඒ අනුව, දිවයින පුරා පළාත් පාලන ආයතනවල මූලිකත්වයෙන් එම පළාත් පාලන බල ප්‍රදේශ තුළ, පරිසරය පවිත්‍ර කිරීම, ඉවත දමන ලද ප්ලාස්ටික් පොලිතීන් එකතු කිරීම, කසළ වර්ගීකරණය හා කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර පවත්වා ගෙන යාම ඇතුළු පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ.

07. එසේම සියළුම රාජ්‍ය ආයතන ප්‍රධානීන් විසින් තම කාර්ය මණ්ඩලය ද, විදුහල්පතිවරුන් විසින් තම විදුහලේ ගුරුභවතුන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද ජගත් පරිසර දිනයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම, කාර්යාල හා පාසල් පරිශ්‍ර පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන පැවැත්වීම, කසළ වර්ගීකරණය කර (ප්ලාස්ටික්/ පොලිතීන් / කඩදාසි / වීදුරු / ලෝහ / කාබනික ද්‍රව්‍ය ලෙස) විධිමත් අයුරින් බැහැර කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමෙන් එම කටයුතු පවත්වාගෙන යාම සහ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කළ යුතු වේ.

08. තවද ජාතික පරිසර සතිය තුළදී රාජ්‍ය ආයතන, පාසල්, පෞද්ගලික අංශය, වැවිලි සමාගම් හා වතු ක්ෂේත්‍රය, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සංවිධානවල මූලිකත්වයෙන් ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව අවධාරණය කරනු කැමැත්තෙමි.

i. නිවසේදී කාර්යාලයේදී පාසලේදී ඉවත දමන ලද ප්ලාස්ටික් එකතු කර කසළ පොළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
ii. කාර්යාලයේදී පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීමට පියවර ගැනීම
iii. විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කිරීම
iv. වෙරළ ආශ්‍රිත පරිසරය කළාප තුළ ප්ලාස්ටික් පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා දිරි ගැන්වීම
v. ලස්සන, පවිත්‍ර රටක් නිර්මාණය කිරීම එක් එක් නිවසින් ආරම්භ කිරීමේ වැදගත්කම සහ පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

vi. ප්‍රදේශයට අනුව හරිත රැකියා හඳුනා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
vii. වන ආවරණය ඉහළ නැංවීමට ක්‍රියාකිරීම හා ග්‍රාමීය මට්ටමින් සහ ආයතන මට්ටමින් රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම සඳහා පැළ තවාන් ඇති කිරීම
viii. ජලපෝෂක, රක්ෂිත ප්‍රදේශ, ගංගා ඉවුරු, තෙත් බිම් ප්‍රදේශ වැනි පරිසර සංවේදී භූමි හඳුනා ගැනීම හා ඒවා සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
ix. හානියට පත් භූමි පුනරුත්ථාපනය, පාංශු සංරක්ෂණය හා තිරසර ඉඩම් කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
x. ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා කටයුතු කිරීම
xi. හරිත වෙරළ සංකල්පයට අනුව වෙරළ තීරයේ තුරු ආවරණය වැඩිදියුණු කිරීම හා වෙරළ කලාප පවිත්‍ර කිරීම
xii. වෙරළ පරිසර පද්ධති තිරසර කළමනාකරණය හා කඩොලාන සංරක්ෂණයට ක්‍රියාමාර්ග ගැනීම

09. සෑම ආයතනයක් විසින්ම ඉහත යෝජිත පරිදි සුදුසු පරිසර සංරක්ෂණ වැඩසටහන් ජාතික පරිසර සතිය තුළදී ඉටුකිරීම සඳහා පූර්ව සැලසුම් සකස් කර දේශපාලන නායකත්වයේ ද සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම සුදුසු බව වැඩිදුරටත් දන්වමි.

10. ජාතික පරිසර සතිය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය https://drive.google.com/drive/folders/1N9evbvEQzZOX_OkCGDN-pf1K46M0O_fC?usp=sharing සබැඳිය මඟින් හෝ එසේ සිදුකිරීමට අපහසු අවස්ථාවකදී දෘඩ පිටපතක් මඟින් පරිසර අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

11. ඉදිරි වර්ෂයන්හිදී ජාතික පරිසර සතියක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් එම වැඩසටහන් තම ආයතනවල, දිස්ත්‍රික්කවල හෝ පළාත්වල වාර්ෂික සැලසුම්වලට ඇතුළත් කර ගැනීමට ක්‍රියා කරන මෙන් ද කාරුණිකව දන්වා සිටිමි.

12. මෙම කාර්යයන් සිදු කිරීමේදී රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රතිපාදනවලට අදාළව ක්‍රියාකරන ලෙසද දන්වා සිටිමි.

පරිසර සංවේදී ප්‍රජාවක් බිහිකිරීම සඳහා ඔබ දක්වන සහයෝගය අතිශයින් අගය කරමි.

වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්

පිටපත්

01. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
02. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
03. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු. දැ.ගැ.ස.